


උපන් බිම වෙනුවෙන් උතුම් දිවි කැප කල මෙන්ම අබාධිතව තම ජීවිතයේ සුන්දරම අවදිය ජාතියේ නාමයෙන් පරිත්‍යාගකල දැයේ සුජාත විරෝධාර පුතුන් වෙනුවෙන් සහ 30 වසරක කුරිරු ම්ලේච්ය කොටි ත්‍රස්තවාදය මුලිනුපුටා දැමූ සියලු හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක බලකායන්හි වීර පුතුන් වෙනුවෙන් මෙම උපහාරය පිදේවා.

**"මචං හෙට මම නිවාඩු යන දවස, අනිද්දා මගෙ Wedding එක."**

රාත්‍රී එකොලහාට පමණ ''පුතා යන්න ලැහැස්ති වෙයන් ඉ්ජන මච ඇවිදින් ඉන්නෙ, උබගෙ උටාසබට එක හොදින් කරගෙන ආපහු වරෙන් කොල්ලො'' ඉහල නිළධාරියෙකු හඩ අවදිකලේ එසේය.

එත් එයට පිළිතුරු ලැබුනේ කිසිවෙකුට සිතා ගැනීමටවත් බැරි ලෙසය, ''සර් මම තීරණය වෙනස් කලා මේ අල්ලගෙන ඉන්න විදිහට මට මෙතන දාලා යන්න බැහැ සර්, මගෙ උටාසබට එකට දින ආපහු ගන්න පුලුවන් මෙතන මිස් උනොත් අපිට ආපහු ගොඩක් ෆයිට් කරන්න වෙයි ඒ නිසා මම නිවාඩු යන්නෙ නැහැ සර්''

සියල්ල හොදින් සිදුවිය හෝරා කිහිපයක් ගත වූ තැන දරුණු සටනක අප සොයුරන් නියැළුණු අතර එම සටන අතරතුරදී ඒ වීර චරිතය රුදුරු ත්‍රස්ත්‍රයෙකුගේ ඉලක්කයකට නතු වී ඔහු අප මාතෘභූමියට අහිමි විය.

සිදුවීම් මාලාවක පුංචි මතකයකි මේ. මෙවන් සිදුවීම්කෙතරම්ද?සෙලබාණනි,ඔබ අප මවුබිම වෙනුවෙන් කල අපමණ කැපවීම තුල අපි ඔබට සදා ණය ගැති වෙමු,

හමුදා නායකත්වය පිලිබද කිසිදිනෙක අඩුවක් නොතිබුනු ශ්‍රී ලංකික මවුබිම එතෙක් පැවැති දේශපාලන අපරණීතභාවය, අවුල් ජාලය සහ ඍජු තීරණ ගැනීමේ නොහැකියාව මත නොයෙකුත් ජ්‍යත්‍යන්තර බලවේග සහ බලපෑම් හමුවේ දුර්මුඛ කරවීමෙහි ප්‍රතිපලය ලෙස රටට අහිමිව ගිය හමුදා නායකත්වය කිසිදිනෙක අමතක කල නොහැකිවා සේම එම අඩුව කිසිදිනෙක නැවත පිරවිය නොහැක. . ඒ වීරෝධාර සෙන්පතියන් ජයග්‍රහණය අභියස සිටයදි අකර්මන්‍ය කර වීමට දේශපාලන අධිකාරියේ තිබු නිවටත්වය සහ අශිෂ්ටත්වයේ ප්‍රථිපල ලෙස දවසින් දවස වසරෙන් වසර අප ඒකීය රටක් වශයෙන්ද, ආර්ථිකමය, සමාජිය වශයෙද පිහීමට සහ පවත්වාගෙන යාමට නොහැකි අභියෝගයක් විය. ආත්ම විශ්වාසයෙන් යුතුව තම නගරයේ, ගම්බිමේ , කාර්යාලයේ, වැඩ බිමේ, පැසැලේ, බස් රියේ ජීවත්වීමේ පරිසරය ඉතා අවදා නම්වුයේ කෲරිරි ම්ලේච්ය කොටි ත්‍රස්ත වාදයේ බිහිසුණු බව මුලු ලොවටම පසක් කරමිනි.කොටියාගේ සිහිනය සැබෑ කරවන් නට දෙස් විදෙස් බලවේග තිබුනද සැබෑ ශ්‍රීලංකික අප වෙනුවෙන් හඩ නගන්නට කිසිදු ජ්‍යත්‍යන්තර ආයතනක් නොතිබිනි.

අද මිනිස් අයිතිවාසිකම් ගැන වහසි බස් දොඩන මිනිස් අයිතිවාසිකම් සුරකින සංවිධාන සිටියේ නැත.
මෙවන් ඉතා අවිනිශ්චිත කාල සීමාවක දේශපාලන බල අධිකාරිය ජාතියේ පිනින් උපන් සැබෑ ශ්‍රී ලාංකික උතුම් පුතෙක් වු මහින්ද රාජපක්ෂ ශ්‍රීමතාණන් වෙත ලැබීම ජාතියේ උපන් නූපන් දු පුතුන් ලද ඉමහත් භාග්‍යකි. එතුමා විසින් පත්කල ආරෂක ලේකම් සෙන්පති ගෝටාබය රාජපක්ෂ මහතා සියලු හමුදා සහසම්බන්ද කරමින් මෙහෙයවනු ලැබූ මානුෂීය මෙහෙයුම තුලින් 30 වසරක යුධ ශාපය මුලිනුපුටා දැමූයේ වසර දහයක් ගතවුනු අද දවස වෙනතෙක් කිසිම යුධමය සිදුවීමක් හෝ යුධමය මානසිකත්වයක්ද ඉතිරි නොකරමිනි.

ශ්‍රී ලංකාවේ පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාටත් එවකට ආරක්ෂක ලේකම්ව සිටි ගෝටාබය රාජපක්ෂ මැතිදුන්ටත් රට ජාතිය බේරා ගැනීමට සියලු සෙන්පතියන් , සියලු විරුවන් එක් ධජයක් යටතට ගෙන ජාතියට දුන් නිදහස සාමකාමී බව මෙන්ම පුණර්ජීවනයට මෙම දසවැනි රණවිරු උපහාර, අභිමාන වත් උපහාරයක් වේවා.

අභිමානයෙන් යුතුව රණවිරුන් සැමරීම වරදක් ලෙස දකින ව්‍යාජ මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් හඩ නගන යුගයෙක, අභිමානයෙන් යුතුව නිර්භයව එම යුතුකම ජාතික මෙහෙවර ඉටු කිරීම තුලින් ශ්‍රී ලංකික ජන ප්‍රජාවට යම් පණිවිඩයක් අපිට දීමට ඇත්තෙමු, ඒ දේශපාලන මෙන්ම සමාජීය වෙනස්කම් පසෙකලා අප හා එක්වී ඔබේ යුතුකම ඉටුකරන්නට අප හා කාරුණිකව එක්වන ලෙසයි.

රණවිරුවා උතුම් මිනිසෙකු ලෙස තම ජීවිතය කැප කරමින් අපගේ ආරක්ෂකයා ලෙසින් රට ජාතිය බේරා ගැනීම තුල සියලු ගෞරව ආදරයට ලක්විය. එහෙත් අද ඔවුන් ජ්‍යත්යන්තර බලපෑම මත දේශපාලන හස්තයේ ගොදුර බව අප ඉතා පැහැදිලිව දන්නා සත්‍යයකි, එවන් වකවානුවක ඔවුන් වෙනුවෙන් හැකි සෑම දෙයක්ම ඉෂ්ඨ කිරීම ඔවුන් වෙනුවෙන් නැගී සිටීම අපගේ පරම යුතුකම වෙනු ඇත.

**සුරකිමු ලංකා මෙල්බර්න්**

## පහුගිය වසරේ අභිමානවත් ලෙස පැවති රණවිරු සැමරුමෙහ මතකසටහන්

